අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය - පිරිවෙන් අධ්‍යාපන අංශය

Ministry of Education, Higher Education and Vocational Education - Piriven Education Division

கல்வி, உயர்கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சகம் - பிரிவேனா கல்விப் பிரிவு

# අන්තර් පාරිවේණික සිසු නිපුණතා ඇගයීම - 2025

## දිස්ත්‍රික් වටය

## උපදෙස් පත්‍රිකාව

### 1. ශාසනික චර්යා කුසලතා

මෙම නිපුණතාව ඇගයීම පූර්ව ප්‍රථමික, ප්‍රථමික අංශ දෙක සඳහා පමණක් පැවැත්වේ. විනිශ්චය මණ්ඩලය මගින් නියම කරනු ලබන ශාසනික චර්යාවන් නිවැරදි ශාසනික පිළිවෙත් අනුව සිදු කර පෙන්විය යුතු ය.

#### 1.1 අභිමතාර්ථ

II. ශාසනික වත් පිළිවෙත් හා සාම්ප්‍රදායයන් පිළිබඳ නිවැරදි ක්‍රමවේද පුහුණු කිරීම.

III. පටිපත්ති හා පටිවේධ ශාසනය ආරක්ෂා කර ගැනීම සඳහා පෙළඹවීම.

IV. ශාසනික ශ්‍රද්ධාව ඇති කිරීම.

#### 1.2 ඇගයීම් කොන්දේසි

I. විනිශ්චය මණ්ඩලය මගින් එම මොහොතේ නියම කරනු ලබන ශාසනික චර්යාවන් විනයානුකූල ශාසනානුලෝමික අයුරින් ඉටු කළ යුතු ය.

II. සෑම ඉදිරිපත් කිරීමක් ම ශාසනික ශ්‍රද්ධාව ඇති වන අයුරින් ඉදිරිපත් කළ යුතු ය.

III. ඉදිරිපත් වන සියලු දෙනා හිස රැවුල් බා පත්කඩය, වටාපත ආදි අවශ්‍ය උපකරණ රැගෙන ආ යුතුය.

IV. විනිශ්චය මණ්ඩලයේ තීරණය අවසානාත්මක වේ.

#### 1.3 නිපුණතා අංශ

I. පිණ්ඩපාතයේ වැඩමවීම

II. භාවනාවේ විවිධ ඉරියව්

III. සඟමහලු පිළිවෙළ

IV. නිවැරැදි ගමන් විලාසය

V. දානය වැළඳීමේ නිවැරැදි ක්‍රම

VI. වත් පිළිවෙත් පැවැත්වීමේ ශාසනික ක්‍රම

#### 1.4 ලකුණු ලබා දීමේ ක්‍රමය

| | | |
|---|---|---|
| I. | ශාසනානුලෝමික බව | 20 |
| II. | නිවැරැදි පටිපාටිය | 20 |
| III. | අවබෝධය | 20 |
| IV. | ශ්‍රද්ධා සම්පන්න බව | 20 |
| V. | සමස්තය | 20 |
| | මුළු එකතුව | 100 |